රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils & Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No: HA/3/7/28-4

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.09.18

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**පරිපාලන ග්‍රාම නිලධාරී සහ ග්‍රාම නිලධාරී වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම - 2024**

මේ සමඟ අමුණා ඇති ලේඛනයන්හි සඳහන් වාර්ෂික ස්ථාන මාරුවීම් පහත සඳහන් ආකාරයට ක්‍රියාත්මක වන පරිදි අනුමත කරමි. මේ බව ඔබ කාර්යාලයේ අදාළ නිලධරයන් වෙත දන්වා නියමිත දිනයේදී නව සේවා ස්ථානයේ වැඩ බාර ගන්නා ලෙස ඔවුන්ට දැනුම් දෙන ලෙස කාරුණිකව දන්වමි.

I. ග්‍රාම නිලධාරී - 2024.01.01 දින සිට

II. පරිපාලන ග්‍රාම නිලධාරී - නිලධාරීන්ගේ නම් ඉදිරියෙන් දිනයන් සඳහන් කර ඇති ස්ථාන මාරු වීම් එම දිනයේ සිට ද, අනෙකුත් ස්ථාන මාරු වීම් ඉදිරියේදී දැනුම් දෙනු ලබන දින සිට ද ක්‍රියාත්මක වේ.

02. අදාළ නිලධරයන් නව සේවා ස්ථානයේ රාජකාරී භාර ගැනීමට හැකි වන සේ වර්තමාන සේවා ස්ථානයෙන් මුදා හැරීමට කටයුතු කරන ලෙස දන්වන අතර, මෙම ස්ථාන මාරු වීම් ප්‍රමාදයෙන් තොරව අදාළ දිනයන්ට ක්‍රියාත්මක කළ යුතු බව ද දන්වමි.

03. මෙම ස්ථාන මාරු නියෝග සම්බන්ධයෙන් කෙරෙන අභියාචනා අමාත්‍යාංශ අභියාචනා මාරු මණ්ඩලය වෙත 2023.10.04 දිනට පෙර ඉදිරිපත් කළ යුතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කළ යුතුය. ඉන් පසුව ඉදිරිපත් වන අභියාචනා සළකා බලනු නොලැබේ.

04. අදාළ නිලධාරීන්ගේ ඉල්ලීම මත සිදු කරන මෙම ස්ථාන මාරුවීම් සඳහා ගමන් වියදම් හෝ උපවේශන දීමනා ගෙවනු නොලබන බව වැඩිදුරටත් දන්වමි.

ජී.අයි.සජීවනී පෙරේරා
අතිරේක ලේකම්
(ස්වදේශ කටයුතු) - රා.ආ

අත්/කළේ:- කේ.ඩී.එන්.රංජිත් අශෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය